# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල


| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.11.26 පැය 2030 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/2114/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.**

**01. වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයකට සම්බන්ධ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - ගාල්ල දිසා අපරාධ කොට්ඨාසය.**

2025.11.04 වන දින අම්බලන්ගොඩ පොලිස් වසමේ අම්බලන්ගොඩ නගර සභාව ආසන්න මාර්ගයේදී ගිනි අවියකින් වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයක් සිදු කිරීමේ අපරාධයට අදාලව සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා ගාල්ල දිසා අපරාධ කොට්ඨාශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් විමර්ශන ආරම්භ කර තිබුණි.

ඒ අනුව, 2025.11.25 වන දින කතරගම පොලිස් වසමේ සෙල්ලකතරගම ප්‍රදේශයේදී ගාල්ල දිසා අපරාධ කොට්ඨාසයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත ඉහත අපරාධයේ ප්‍රධාන සැකකරු අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 02 මිලිග්‍රෑම් 60 ක් හා එම අපරාධයට ආධාර අනුබල දුන් සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරුවන් අවුරුදු 30 සහ 44 වයස්වල පසුවන මීටියාගොඩ සහ සෙල්ලකතරගම ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

ප්‍රධාන සැකකරු 2025.11.25 වන දින බලපිටිය ගරු මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු දින 07 ක රැඳවුම් නියෝග ලබා ගෙන සිදුකරන ලද වැඩිදුර විමර්ශනයේදී අනාවරණය වූ තොරතුරු මත මීටියාගොඩ, එරනවිල ප්‍රදේශයේ සැකකරුගේ නිවස පිටුපස වලදමා තිබූ රිවෝල්වර අවියක් සහ එම අවියට යොදන පතරොම් 02 ක් 2025.11.26 වන අද දින විමර්ශන නිලධාරීන් විසින් සොයාගෙන ඇත.

ගාල්ල දිසා අපරාධ කොට්ඨාස වැඩිදුර විමර්ශන කටයුතු සිදු කරනු ලබයි.

**02. මාරක රිය අනතුරක් - ගිරාඳුරුකෝට්ටේ පොලිස් වසම.**

2025.11.25 වන දින සවස් කාලයේ ගිරාඳුරුකෝට්ටේ පොලිස් වසමේ බෝගම්පිටිය හෙබරව මාර්ගයේ කිලෝමීටර් 03 කණුව අසන්නයේදී බෝගම්පිටිය දෙසට ධාවනය වූ යතුරුපැදික් මාර්ගයේ පෙරළී ගොස් ප්‍රතිවිරුද්ධ දිසාවෙන් පැමිණි බස් රථයක ගැටී බස් රථයේ පසුපස ටයරයට යතුරුපැදිකරු යටවී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරුපැදිකරු ගිරාඳුරුකෝට්ටේ රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 49 ක් වූ ගිරාඳුරුකෝට්ටේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය පශ්චාත් මරණ පරීක්ෂණයෙන් පසු ඥාතීන් හට භාරදී ඇත. බස් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර ගිරාඳුරුකෝට්ටේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**